# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,557—1965 නොවැම්බර් 13 වැනි සෙනසුරාදා—1965.11.13

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### රේගු නිවේදනය අංක 61/9/207

ආදයම් රක්ෂණ ආඥපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12,781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින දාන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥව අනුව, 1965 නොවැම්බර් මස 15 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක කක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

මේ තීරු ගාස්තුව රේගු ආඥපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :—

| රබර් | රු. ශ. |
|---|---|
| නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට ... ... ... | 1 05 |
| ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට ... ... ... ... ... | 0 07 |

අංක ඒ. 781.
1965 නොවැම්බර් මස 13 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

ශ. කුමාරණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

11-648

### රේගු දැන්වීම අංක 64/5/67

1964 අගෝස්තු මස 8 වෙනි දින අංක 14,138 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1964.10.16 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්, 1962 අංක 19 දරණ ආදයම් සංරක්ෂණ පනතේ 2 වන ඡෙදය යටතේ පැනෙන ආඥව ක්‍රියාත්මක කිරීම සඳහා, 1965 නොවැම්බර් මස 15 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිලිප්පයින් කොප්පරාවල කක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් අමෙරිකානු ඩොලර් 218 1/10 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | අමු පොල් ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|
| රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 295 22 ... | 292 86 ... | 248 70 ... | 73 80 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

අංක ඒ. 744/22,
1965 නොවැම්බර් මස 13 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

ශ. කුමාරණතුංග,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

11-649


ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

1603—ආර් 10121—6,925 (65/11)